# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 19 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 ජූනි මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජූනි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

# 2000 අංක 19 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන)

[සහතිකය සටහන් කළේ 2000 ජුනි මස 08 වන දින]

**එල්. ඩී— ඕ. 26/98**

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

මෙතෙක් කල් ගාල්ල රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ආගමික බල ප්‍රදේශය යටතේ පැවති ප්‍රදේශයෙන් කොටසක රත්නපුර රෝමානු කතෝලික රදගුරු වසම නමින් නව රදගුරු වසමක් බවට පත්කොට එය පරිපාලනය කිරීම සඳහා, අතිගරු දේවධර්මාචාර්ය පී. දොන් ඇල්බට් මැල්කම් රංජිත් රාජගුරු ප්‍රසාදීන් වහන්සේ රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වශයෙන් යථා පරිදි පත් කරනු ලැබ ඇති හෙයින් ද :

රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීමට විධිවිධාන සලස්වන පරිදි සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ද ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම අවස්ථානුකූල වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඩු නාමය.

1. මේ පනත 2000 අංක 19 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

338 අධිකාරයට 3ඈ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. 1991 අංක 7 දරන පනතින් අවසන්වරට සංශෝධනය කරන ලද පරිදි වූ (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනතේ 3ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම පනත තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.-

"රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීම.

3ඇ. රත්නපුර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ, එනම් අතිගරු දේවධර්මාචාර්ය පී. දොන් ඇල්බට් මැල්කම් රංජිත් රාජගුරු ප්‍රසාදීන්වහන්සේ සහ රෝමානු කතෝලික සභාවේ නීති හා ව්‍යවහාරයන් අනුව යථා පරිදි පත් කරනු ලබන එතුමන්ගේ අනුප්‍රාප්තිකයන් ද සංස්ථාවක් වන අතර ඒ සංස්ථාව මේ ආඥාපනතේ සියලු කාර්ය සඳහා "රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ " නමින් හැඳින්වෙන්නේ ය. තව ද එම නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් එයට ඇති අතර සෑම විස්තරයකම චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමේ, මිලට ගැනීමේ, ලබා ගැනීමේ, දරාසිටීමේ හා භුක්ති විඳීමේ ද එකී දේපළ විකිණීමේ හෝ ඒ පිළිබඳව අන් ආකාරයකින් සුදුස්සක් කිරීමේ ද පූර්ණ බලය ඒ සංස්ථාවට ඇත්තේ ය. ඒ දේපළ සම්බන්ධයෙන් ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5ඈ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5ඈ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5ඈ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත දේපළ සතු කර දීම.

5ඈ. එකී අතිගරු දේවධර්මාචාර්ය පී. දොන් ඇල්බට් මැල්කම් රංජිත් රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් උන්වහන්සේගේ නිල තත්ත්වයෙන් දැනට අත් කර ගෙන ඇති, දරනු ලබන හෝ සන්තකයෙහි තබා ගෙන සිටින චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම සියලු දේපළ ඒවා කෙරෙහි බලපාන යම් භාරයකට හෝ කොන්දේසියකට හෝ යටත්ව එකී රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත සතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1991 අංක 7 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (4) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(5) රත්නපුර රෝමානු කතෝලික රදගුරු වසම ඇති කිරීමේ හේතුවෙන් රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පරිපාලනයට යටත් වන්නා වූ සියලු චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් රත්නපුර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ නමට ගාල්ල රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් ලියා අත්සන් කරන ලද යම් හිමිකර දීමේ හෝ පැවරීමේ කවර සාධන පත්‍රයකට වුව ද 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 2 වන වගන්තිය යටතේ යම් සාධන පත්‍රයක් සඳහා අය කරනු ලබන නියමිත මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.